# ජ වි පෙ හා පොලීකාරයෝ

පසුගියදා අපට ආධාර දෙන්නේ යැයි කියන ලෝක පොලීකාර රටවල් කණ්ඩායමෙහි සම සභාපතිවරු තුන් දෙනකු ප්‍රකාශයක් කරමින් කියා සිටියේ සාම ක්‍රියාවලිය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරකම් පිළිබඳව තමන් පුදුමයට පත්වන බව ය. ඔවුන්ට අනුව ජ වි පෙ සාම ක්‍රියාවලිය කඩා කප්පල් කරයි. මේ පොලියට ණය දෙන්නන්ගේ ප්‍රකාශය පිළිබඳව නම් අප පුදුමයට පත්වන්නේ නැත. එයට හේතුව ජපානය ද ඇතුළත් මොවුන් කවුදැයි අප හොඳින් දන්නා බැවින් ය. අද මේ අයගේ ඊනියා සාම ක්‍රියාවලිය පවා කඩාකප්පල් කරන්නේ කොටි සංවිධානය යැයි කිවහැකි වුව ද, ආධාර නමින් ණය දෙන්නෝ එසේ නොකියති. ඉතා පැහැදිලිව කොටින්ට අවශ්‍ය අන්තර්වාර පාලනය නමින් හඳුන්වනු ලබන පාලන ව්‍යුහය ලබා ගැනීම ය. මෙය ඊළමක් මිස අනෙකක් නොවන බව ඉන්දියාවේ ද පිළිගැනීම ය. කොටින්ගේ මේ අන්තර් ස්වයං පාලන ඒකාධිකාරිය පිහිටුවීමට එක්සත් ජාතික පක්ෂය එකඟ වුව ද සන්ධාන ආණ්ඩුව මේ දක්වා විරුද්ධත්වය පළකරමින් සිටියි. එසේ ආණ්ඩුව විරුද්ධත්වය පළකරන්නේ ජ වි පෙරමුණේ බලපෑම මත බව ද පැහැදිලි ය. ජ වි පෙ නොසිටින්නට මේ වන විටත් බෞද්ධ විරෝධී විජය කුමාරතුංග ප්‍රතිපත්ති මිස බණ්ඩාරනායක ප්‍රතිපත්ති නොදත් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය කොටින්ගේ හා පොලියට ණය දෙන්නන්ගේ යෝජනාවට එකඟ වී අවසාන ය.

පොලීකාර සභාපතිවරුන් ජ වි පෙ සාමයට අකමැති යැයි කියනවිට ඔවුන් එයින් අදහස්කරන්නේ ජ වි පෙ ඔවුන්ගේ සාමයට අකමැති බව ය. සාමය යනුවෙන් එක් දෙයක් නැත. විවිධ අය සාමය යනුවෙන් හඳුන්වන්නේ විවිධ දෑය. අපට අවශ්‍ය සාමය ලැබෙන්නේ ඒකීය රටයක ය. ඒකීය රට යනු අන්කිසිවක් නොව දුටුගැමුණු රජු දවස සිට පැවත එන එක්සේසත් රාජ්‍යයකි. ඒකීය යන්න බ්‍රිතානීන් විසින් හඳුන්වාදෙනු ලැබුවක් සේ සලකන්නෝ බටහිර දැනුම එකම දැනුම ලෙස සලකන ඊනියා ප්‍රබුද්ධයෝ හා ඇංකරයෝ වෙති. ඔවුහු තවමත් වාස්තවිකත්වය, ව්‍යුහයෙහි ඇති න්‍යාය (ඔවුන් එයට වැරදි ලෙස තර්කය යැයි යොදාගනු දැකිය හැකිය) ආදී බටහිර ක්‍රිස්තියානි සංකල්පවල ඇලුණෝ වෙති. මොවුන්ගෙන් ඇතමකු විද්‍යුත් නාලිකා ඔස්සේ තම ක්‍රිස්තියානි පක්ෂපාතීත්වය පෙන්වමින් මෙරට තිබූ යුවරාජධානි ස්වාධීන  රාජ්‍ය ලෙස හඳුන්වන්නේ කිසිම සාධකයක් නොමැතිව ය. කොටි සංවිධානයට සාමය යනු ඊළමක ඇතිවන සාමයකි. පොලීකාරයන්ද සාමය යැයි කියන්නේ කොටින්ගේ සාමයට ය. ජ වි පෙ එවැනි සාමයකට විරුද්ධවීම පොලීකරුවන් දකින්නේ සාමයට විරුද්ධවීමක් ලෙස ය. ඔවුහු ඔවුන්ගේ සාමය එකම සාමය යැයි හඳුන්වති. එහි දී ඔවුන්ගේ පිහිටට එන්නේ ගණිකා වෘත්තියෙහි යොදවන වාස්තවිකත්වය, යථාර්ථය වැනි අර්ථශූන්‍ය වචන ය.

පොලීකාරයන් සූදානම්වන්නේ සිංහලයන් විශේෂයෙන් ම සිංහල බෞද්ධයන් බිය වද්දා ඔවුන්ගේ සාමයට  අප කැමතිකරවා ගැනීමට ය. ඔවුන් ජ වි පෙරමුණේ ඊනියා සාම විරෝධයක් ගැන කියන්නේ මතු සූදානමක් ඇතිව ය. මෙහි දී අප කළ යුත්තේ කුමක් ද? ඇතැමුන් කියනු ඇත්තේ අප බටහිරයන්ට අවශ්‍ය අන්දමට හැසිරිය යුතු බව ය. අද බටහිරයන්ගේ ආධිපත්‍යය යථාර්ථයක් බවත් එයට විරුද්ධව අපට කළහැකි දෙයක් නොමැති බවත් ඔවුන් කියනු ඇත. බොරු සමාජ විශ්ලේෂකයන් කියනු ඇත්තේ තමන්ගේ කාර්යය සමාජය පවතින ආකාරයෙන් විශ්ලේෂණය කිරීම මිස එය වෙනස්කිරීමට කටයුතු කිරීම නොවන බව ය. ඇතැමුන් ඒ වෙනස්කිරීම සඳහා කෝඳුරු තෙල් හත්පට්ටයක් ඉල්ලනු ඇත. එහි දී මුළු ලෝකයම එකට එකතු වී වැඩකළ යුතු ය වැනි බහුබූත කියනු හැරෙන්නට ඔවුන්ට කිවහැකි වෙනත් දෙයක් නැත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ව්‍යාපෘතියට එරෙහිව මුළු ලෝකයම එකතුකිරීම පසෙක තබා බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ප්‍රවාදවලට විකල්ප ප්‍රවාද නිර්මානයකිරීමට ඔවුන් පියවර ගන්නේ නම් වැඩදායකවනු ඇත. එහෙත් කිසිම නිර්මානශීලීත්වයක් නැති අනුකාරකයන්ට නිර්මානය කළහැකි ප්‍රවාදයක්  නැති බව ද අප අවබෝධ කරගත යුතු ය.

බටහිරයන්ට මුහුණ දීමට අප වැනි කුඩා රටක හැකි ද යන ආකාරයේ ප්‍රශ්න අසනු ඇත්තේ අඟුටුමිට්ටි බුද්ධිමතුන් ය. බටහිරයන් අපේ ඊනියා බුද්ධිමතුන්ට ප්‍රවාද නිර්මානය කර දී ඇත. ඊනියා බුද්ධිමත්තු ඒ ප්‍රවාද ඔස්සේ ලෝකය බලති. එහෙත් අපේ ප්‍රවාද ඔස්සේ ලෝකය බැලූ විට අපට පෙනෙන්නේ කුමක් ද? පළමුවෙන් ම පෙනෙන කරුණ නම් දැනුම ඔස්සේ අප මෙල්ලකිරීමට බටහිරයන් සමත් වී ඇති ආකාරය ය. බටහිරයන්ගේ දැනුම අපේ ද දැනුම බවට පත්කෙරී ඇත්තේ ඊනියා යථාර්ථය, නිරපේක්ෂය, ව්‍යුහාත්මක න්‍යාය (ස්ට්‍රක්චරල් ලොජික් - ලොජික් යන්න අනුකාරකයන්

© Prof. Nalin De Silva

පරිවර්තනය කරන්නේ තර්කය යනුවෙනි. ඒ වැරදිය. රීසනින් යන්නට තර්කනය යැයි යොදාගත හැකි වුව ද තර්කය යන්න යොදාගත හැක්කේ ආර්ගියුමන්ට් යන්නට ය. අනෙක් අතට තියරි යනු න්‍යාය නො වෙයි. තියරි යනු ප්‍රවාද වෙයි.) ආදී වචන ඔස්සේ ය. බටහිරයන්ගේ දැනුම ද සාපේක්ෂ දැනුමක් බවත් ඒ දැනුම යනු ලෝකය ඔවුන් නිර්මානය කරඇති ආකාරය බවත් ඒ එක් දැනුමක් පමණක් බවත් අප පළමුවෙන් ම අවබෝධ කරගත යුතු ය.

දෙවනුව අපට පෙනෙන කරුණ නම් පෙරදිග අපරදිග යනුවෙන් වෙනස් දැනුම් තිබෙන බවත් ඒ පදනම්වන චින්තන වෙනස් බවත් ය. ඉංගිරිසි පොතක් පතක් කියවා ඇති එරික් ඉලයප්පාරච්චි වැන්නෝ උසස් දාර්ශනිකයකු නොවූ ඩෙරීඩාගේ (මහාචාර්ය කලංසූරිය මහතා සඳහන්කරන බටහිර නිර්වචනය අනුව ඩෙරීඩා දාර්ශනිකයකු නොවේ. එහෙත් එය වෙනම කරුණකි. ඉදුවර බලන්න) ඔෆ් ග්‍රැමටලොජි (ඔහු ඒ පොත මුළුමනින්ම කියවා තේරුම්ගෙන ඇත ආකාරයේ අදහසක් ඔහුගේ ලිපිවලින් ගම්‍ය වෙයි.) හා එඩ්වර්ඩ් සයිඩ්ගේ ඔරියන්ටලිසම් ආදී කෘතිවලින් මුලා වී පෙරදිග අපරදිග බෙදුම ම වැරදි යැයි කියති. පෙරදිග අපරදිග යන්න ද්විමය විරුද්ධතා (බයිනරි ඔපසිෂන්ස්) ලෙස ගැනීම වැරදි යැයි ඇතැම් බක පණ්ඩිත බටහිරයෝ කියති. එසේ නොගන්නේ නම් බටහිර දැනුමේ සිරවී සිටින්නන්ට සිදුවන්නේ පෙරදිග හා අපරදිග යනුවෙන් දෙකක් නැති බව කීමට ය. එයින් සිදුවන්නේ බටහිරයන්ගේ මතයක් නැවත වරක් අප මත පටවා අප මුළාකිරීම පමණ ය. සයිඩ්ගේ දෙමව්පියන් කවුරුන් වුවත් ඔහු ද සංස්කෘතික වශයෙන් ක්‍රිස්තියානි වෙයි. ඔවුන් සියල්ලන්ම දැන් සූදානම්වන්නේ ඊනියා ද්විමය විරුද්ධතා ලෙස ලෝකය දැකීම වැරදි යැයි කියමින් ඩෙරීඩා වැනි දෙවැනි පංතියේ චින්තකයන්ගේ කලිසම් කකුලේ එල්ලී පෙරදිගක් නැතිබව කීමට ය.

බෞද්ධ දැනුමක් නොමැති සයිඩ්ලාට ඩෙරීඩාලාට හා මෙරට ඔවුන්ගේ වෙළෙඳ නියෝජිතයන්ට ද්විමය විරුද්ධතා මහා ප්‍රශ්නයක් විය හැකි නමුත් සිංහල බෞද්ධ න්‍යාය (මෙය භාරතයේ ද කලක් තිබිණි . එහෙත් ශංකරාචාර්යයන්ගෙන් පසුව ඇති වූ හින්දු ආගමේ න්‍යාය ත්‍රිකෝටික න්‍යාය වෙයි) වූ චතුස්කෝටිකය අනුව ඇතැම් ප්‍රපංච ද්විමය විරුද්ධතා ලෙස ගත හැකි ය, ගත යුතු ය. පෙරදිග හා අපරදිග යන්න ද එවැන්නකි. පෙරදිග හා අපරදිග යනුවෙන් මුලින්ම ගත්තේ බටහිරයන් යැයි යමකු කියන්නේ නම් ඔහු බෞද්ධ දැනුම ගැන මෙලෝ හසරක් නැත්තකු විය යුතු ය. පූර්ව විදේහය, අපරගෝයානය, අපරාන්තය, සුනාපරන්තය ආදී යෙදුම් ඉලයප්පාරච්චි වැන්නවුන් නොදැන සිටීම ගැන අප පුදුම විය යුතු ද නැත.  ඒ කෙසේ වෙතත්  පෙරදිග ලෙස අපරදිගයන් සලකන දෙයට අපි පෙරදිග යැයි නොකියමු. පෙරදිග යන්න ගැන ද අපේම දැනුමක් වෙයි. අපට එය බටහිරයන්ගෙන් ලබාගත යුතු නො වෙයි. අප භාරතය (වර්තමානයේ නම් ඉන්දියාව) දැකිය යුතුව ඇත්තේ සයිඩ් කියන ආකාරයට බටහිරයන්ගේ ඇසින් නො වෙයි. බටහිරයන් ඉන්දියාව යැයි ගන්නා දේ වැරදි බව අපි දනිමු. එහෙත් එපමණින් අප දන්නා අපේ ඉන්දියාව නැති නො වෙයි. බටහිරයන්  නිර්මානය කරඇති ලෝකය වැරදුනු වහාම ලෝකයක් නැතැයි අපි නොකියමු. අපට අපේ ලෝකය ඇත. බෞද්ධ න්‍යායට අනුව ද්විමය විරුද්ධතා ඇති අවස්ථා මෙන් ම නැති අවස්ථාද වෙයි. ද්විමය විරුද්ධතා පමණක් ඇත්තේ ඇරිස්ටෝටලීය න්‍යායෙහි ය. ඇරිස්ටෝටලීය න්‍යාය යනු චතුස්කෝටිකයෙහි අවස්ථා  දෙකක් පමණකි. ද්විකෝටිකයෙහි ඇතැම් වැරදි දකින ඩෙරීඩාට යැමට තැනක් නැත. ඔහු දන්නා චතුස්කෝටිකයක් නැත. වැඩිම වුවහොත් ඔහු දන්නේ හෙගල්ගේ හා මාක්ස්ගේ කසිකබල් අපෝහකය ය. එහෙත් අපෝහකය යනු ද රූපික ද්විකෝටිකයක් ම පමණක් වෙයි. (විස්තර සඳහා අපෝහකයේ රූපිකය හා මාක්ස්වාදයේ දරිද්‍රතාවය කියවන්න)

තුන්වැනි කරුණ ලෙස අපට පෙනෙන්නේ අපට බටහිරයන්ගෙන් නිදහස්වීම සඳහා අපේ දැනුමක් නිර්මානය කළ යුතු බව ය. බටහිරයන්ගේ  දැනුම යොදාගෙන අප බටහිරයන්ගෙන් නිදහස්වන්නේ කෙසේ ද? බටහිරයන්ගේ දැනුම අපට දමා ඇති නාස් ලණුවක් වෙයි. බටහිරයෝ ඔවුන්ගේ දැනුම යොදාගෙන අප ගොනුන් බවට පත්කරති. අවාසනාවකට ප්‍රබුද්ධයන්ට අර නාස් ලණුව දමාගෙන පුංචි වහුපැටවුන්වීම හැරෙන්නට වෙනත් ලෝකයක් නැත. හතරවනුව අපට පෙනී යන්නේ බටහිර නූතනත්වය යනු මුළු ලොවම ක්‍රිස්තියානිකිරීමේ ව්‍යාපෘතිය බව ය. අද ගෝලීයකරණය යනුවෙන් හැඳින්වෙන්නේ වර්තමානයෙහි ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මකවන ආකාරය ය. පසුගිය අවුරුදු පන්සියයක් තිස්සේ සිදු වී ඇත්තේ බටහිර රෙපරමාදු ක්‍රිස්තියානි සංස්කෘතියට එරෙහි කතෝලික ඇතුළු අනෙක් සංස්කෘතීන් විනාශ කිරීම ය. ජ වි පෙට අද සිංහල බෞද්ධයන් නියෝජනය කිරීමට සිදු වී ඇත. සිංහල සංස්කෘතිය නැතිකිරීමට කටයුතු කරන බටහිර පොලීකාරයෝ ජපානය ද හවුල්කරගනිමින් ජ වි පෙට විරුද්ධව අවි ගැනීමට සූදානම් වෙති.

(මතු සම්බන්ධයි)

© Prof. Nalin De Silva